**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 18/95**

මගේ අංකය: 543ඊ02ඞ02/93/2
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත
හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07
1995.08.08

සියලුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**සාමාන්‍ය ලිපිකාර සේවයේ තනතුරු වලට නියමිත**
**කාර්යයන්හි වෙනත් සේවාවන්ට අයත් නිලධාරීන් යෙදවීම**

සාමාන්‍ය ලිපිකාර සේවයට අයත් තනතුරුවල හා සාමාන්‍ය ලිපිකාර සේවයට අවශ්‍ය නිලධාරීන් විසින් ඉටු කලයුතු රාජකාරි ඉටු කිරීම සඳහා වෙනත් ලිපිකාර සේවාවන්හි නිලධාරීන් මෙන්ම වෙනත් සේවාවන් වල නිලධාරීන් යොදවන බවටත්, එමගින් සාමාන්‍ය ලිපිකාර සේවයේ සංකෝචනයක් සිදුව ඇති බවටත්, ඒකාබද්ධ සේවාවන් පවත්වා ගෙන යැමෙන් රජය බලාපොරොත්තු වන පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට එමගින් බාධා පැමිණ ඇති බවටත්, වෘත්තීය සමිති මගින් රජයට පෙන්වා දෙනු ලැබ තිබේ. මේ නිසා නොයෙකුත් දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ විවිධ ක්‍රම අනුගමනය කිරීම නිසා රාජ්‍ය සේවයේ ඒකීයභාවය රඳවා ගෙන යැම අසීරු වී ඇති බව ඔවුහු වැඩිදුරටත් පෙන්වා දෙනු ලැබ සිටිති.

එසේ හෙයින්, සාමාන්‍ය ලිපිකාර සේවයේ නිලධාරීන්ගේ තනතුරුවල සහ එම නිලධාරීන් විසින් ඉටු කලයුතු රාජකාරි කටයුතුවල සමාන්තර සේවාවන් හෝ වෙනත් සේවාවන්හි නිලධාරීන් නොයොදවන ලෙසත්, දැනටමත් එසේ පැවරීමක් කර ඇත්නම්, එය නිවැරදි කරන ලෙසටත්, මෙයින් දන්වා සිටිනු ලැබේ.

අ.කලේ/(**ආර්.එස්.ජයරත්න**)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය